දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ–மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.

'இசுருபாயா'
பத்தரமுல்ல.

"Isurupaya"
Battaramulla.


ඔබේ අංකය / உமது இல. / Your No. } ..................

මගේ අංකය / எமது இல. / My No. } ED/01/101/02/02/01

දිනය / திகதி / Date } 2017.04. 28

අමාත්‍යාංශ චක්‍රලේඛ : 18/2017

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලුම පළාත්/ කලාප ගණිත විෂයය භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලුම ගණිත ගුරුඋපදේශකවරුන්,

සියලුම විදුහල්පතිවරුන් සහ

සියලුම පරිවෙනාධිපතිවරුන් වෙත.

## සමස්ත ලංකා ගණිත දැනුම මිනුම තරගාවලිය

අංක 11/2014 දරණ 2014.04.04 දිනැති සමස්ත ලංකා පාසල් ගණිත තරගාවලිය චක්‍රලේඛය මෙයින් අවලංගු කෙරෙන අතර 2017 වර්ෂයේ සිට සමස්ත ලංකා ගණිත දැනුම මිනුම තරගාවලිය මෙම චක්‍රලේඛයේ විධිවිධාන පරිදි පැවැත්විය යුතු වේ.

සෑම වසරක දී ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ගණිත ශාඛාවේ මූලිකත්වයෙන් පැවැත්වෙන සමස්ත ලංකා පාසල් ගණිත තරගාවලිය මෙම වර්ෂයේ සිට සමස්ත ලංකා ගණිත දැනුම මිනුම තරගාවලිය ලෙස හැඳින්වෙන අතර ගණිත දැනුම මිනුම තරගාවලියකට පමණක් සීමා වේ. එමෙන්ම මෙම වසරේ සිට විද්‍යායතන පිරිවෙන්වල සිසුන් සඳහා ද සහභාගී විය හැකි වන පරිදි විද්‍යායතන පිරිවෙන් සඳහා ද සමස්ත ලංකා ගණිත දැනුම මිනුම තරගාවලියක් පැවැත්වේ.

සමස්ත ලංකා මට්ටමේ තරග පවත්වන ආකාරයත්; පාසල්, පිරිවෙන්, කොට්ඨාස, කලාප සහ පළාත් මට්ටමේ තරග පැවැත්වීමෙන් අනතුරුව එක් එක් තරග ඉසව් සඳහා පළාත නියෝජනය කරන සිසු කණ්ඩායම් ඊට සහභාගි කරවිය යුතු ආකාරයත් පිළිබඳව මෙම චක්‍රලේඛයේ උපදෙස් අනුගමනය කළ යුතු වේ.

## 1.0 සමස්ත ලංකා ගණිත දැනුම මිනුම තරගාවලිය හැඳින්වීම

අධ්‍යාපන අමාත්‍යාංශයේ ගණිත ශාඛාව විසින් 2011 වර්ෂයේ සිට පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දිවයිනේ සියලුම රජයේ පාසල්වල ගණිත විෂයය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඉලක්ක කර ගනිමින් මෙම දැනුම මිනුම තරගාවලිය සංවිධානය කර පවත්වාගෙන යනු ලැබේ. 2017 වසරේ දී ජාතික මට්ටමින් පමණක් රජයේ පාසල්වල 12, 13 ශ්‍රේණිවල සිසුන් සහ විද්‍යායතන පිරිවෙන්වල 9, 10 ශ්‍රේණිවල සිසුන් සඳහා සහභාගි විය හැකි පරිදි දැනුම මිනුම තරගාවලියක් පැවැත්වේ.

## 1.1 සමස්ත ලංකා ගණිත දැනුම මිනුම තරගාවලියේ සුවිශේෂී අරමුණු

1. ගණිත විෂයය දැනුම සම්බන්ධව ගුරු සිසු දෙපිරිසගේ ම බුද්ධි කලම්බන අවස්ථා ඇති කිරීම තුළින් දැනුම සහ කුසලතා සංවර්ධනය
2. සිසුන් තුළ ඇති ගණිත විෂයයට අදාළ විභව්‍යතා එළිදැක්වීමට සහ ඇගයීමට අවකාශ සැලසීම මගින් ඔවුන්ගේ ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය.
3. සුහග සිසුන් හඳුනාගෙන ජාතික හා ජාත්‍යන්තර තලයේ ගණිත ක්ෂේත්‍රයෙහි ගෞරවනීය ස්ථානයක් හිමිකර ගැනීමේ ශක්‍යතා වර්ධනය කිරීම.

## 2.0 සමස්ත ලංකා ගණිත දැනුම මිනුම තරගාවලිය පිළිබඳ උපදෙස් සහ පොදු නීතිරීති

සමස්ත ලංකා ගණිත දැනුම මිනුම තරගාවලි මාලාව පිළිබඳව පොදු උපදෙස් සහ ක්‍රමවේදය අංක 2.1 ඡේදය යටතේ සවිස්තරව දක්වා ඇත.

ජාතික මට්ටමේ **ගණිත දැනුම මිනුම තරගාවලිය** පැවැත්වෙන ස්ථාන සහ දින අධ්‍යාපන අමාත්‍යාංශයේ ගණිත ශාඛාව විසින් තීරණය කරනු ලැබේ. ඊට අදාළ විස්තර සහ උපදෙස් සමස්ත ලංකා තරග ආරම්භ කරන දිනට <u>සිව් මසකට පෙර</u> නිවේදනය කෙරේ.

## 2.1 පොදු උපදෙස් සහ ක්‍රමවේදය

2.1.1 <u>සමස්ත ලංකා ගණිත දැනුම මිනුම තරගාවලිය</u> සඳහා සිංහල, දෙමළ භාෂා මාධ්‍ය සහ ද්විභාෂා අධ්‍යාපන වශයෙන් වෙන් කිරීමකින් තොරව කණිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ - 1 සහ ජ්‍යෙෂ්ඨ - 2 ඉසව් තුන යටතේ එක් ඉසව්වකින් කණ්ඩායම බැගින් පළාතකින් කණ්ඩායම් තුනක් ඉදිරිපත් කළ යුතු වේ. එහි දී සමස්ත ලංකා ගණිත දැනුම මිනුම තරගාවලිය සඳහා පළාත නියෝජනය කරන කණ්ඩායම්වල භාරකාරත්වය දරමින් පළාත් ගණිත විෂයය සම්බන්ධීකරණ නිලධාරි ඊට සහභාගි වීම අනිවාර්යය වේ.

2.1.2 ජ්‍යෙෂ්ඨ - 2 ඉසව්ව යටතේ 12, 13 ශ්‍රේණි සඳහා 2017 වසරේ දී ජාතික මට්ටමින් පමණක් තරගාවලියක් පැවැත්වෙන අතර ඒ සඳහා පළාත් මට්ටමින් වගු අංක 1ට අනුව කණ්ඩායමක් ඉදිරිපත් කළ හැකි ය. එම ජාතික මට්ටමේ තරගාවලිය ද අනෙක් තරගාවලි සේ ම පැවැත්වේ.

2.1.3 පිරිවෙන් යටතේ 9, 10 ශ්‍රේණි සඳහා 2017 වසරේ දී ජාතික මට්ටමින් පමණක් තරගාවලියක් පැවැත්වෙන අතර ඒ සඳහා පළාත් මට්ටමින් වගු අංක 1ට අනුව විද්‍යායතන පිරිවෙන්වලින් කණ්ඩායමක් ඉදිරිපත් කළ හැකි ය. එම ජාතික මට්ටමේ තරගාවලිය ද අනෙක් තරගාවලි සේ ම පැවැත්වේ.

2.1.4 ජ්‍යෂ්ඨ - 2 ඉසව්ව සහ විද්‍යායතන පිරිවෙන්වලින් පළාත නියෝජනය කරන කණ්ඩායම් පළාත් ගණිත විෂයය සම්බන්ධීකරණ නිලධාරිගේ පූර්ණ අධීක්ෂණය සහ භාරකාරත්වය යටතේ ඊට සහභාගි වීම අනිවාර්යය වේ.

2.1.5 සමස්ත ලංකා මට්ටමට ඉදිරිපත් කරන කණ්ඩායම් තෝරා ගැනීම සඳහා අදාළ පළාත තුළ මෙම තරගාවලියේ <u>අරමුණුවලට ගැළපෙන පරිදි</u> කොට්ඨාස, කලාප සහ පළාත් මට්ටමින් තරග සංවිධානය කළ යුතු ය. ඒ සඳහා කොට්ඨාස, කලාප මට්ටමේ තරග පළමුව පවත්වා ඉන් ජයග්‍රහණය ලබන කණ්ඩායම් පළාත් මට්ටමේ තරගය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

2.1.6 මීට අදාළ සියලුම කොට්ඨාස, කලාප සහ පළාත් තරග කලාප ගණිත විෂයභාර නිලධාරි විසින් ද, පළාත් තරග පළාත් ගණිත විෂයය සම්බන්ධීකරණ නිලධාරි විසින් ද සංවිධානය කළ යුතු ය. තරගාවලියේ අරමුණු සාක්ශාත් කරගැනීම පිණිස කලාපයේ උපරිම පාසල් සංඛ්‍යාවක් තරගාවලියට ඉදිරිපත් කිරීමට කලාප ගණිත විෂයය භාර නිලධාරි ක්‍රියා කළ යුතු ය. එලෙස කලාපය විසින් හඳුනාගන්නා ලද පාසල්වල තරග කණ්ඩායම් පුහුණු කර ඉදිරිපත් කිරීමේ පූර්ණ වගකීම පාසල්වල විදුහල්පති වෙත පැවරෙන අතර ඊට අදාළ උපදේශනය ගණිත ගුරු උපදේශකවරුන් විසින් සැපයිය යුතු ය.

2.1.7 ජ්‍යෂ්ඨ - 2 ඉසව්ව සහ විද්‍යායතන පිරිවෙන්වලින් පළාත නියෝජනය කරන කණ්ඩායම් පළාත් ගණිත විෂයය සම්බන්ධීකරණ නිලධාරි විසින් සංවිධානය කළ යුතු ය. තරගාවලියේ අරමුණු සාක්ශාත් කරගැනීම පිණිස පළාතේ උපරිම පාසල් සහ විද්‍යායතන පිරිවෙන් සංඛ්‍යාවක් අතරින් ජාතික තරගාවලියට සිසුන් ඉදිරිපත් කිරීමට කලාප ගණිත විෂයය භාර නිලධාරි ක්‍රියා කළ යුතු ය. එලෙස කලාපය විසින් හඳුනාගන්නා ලද පාසල්වල සහ පිරිවෙන්වල සිසුන් පුහුණු කර ඉදිරිපත් කිරීමේ පූර්ණ වගකීම පාසල්වල විදුහල්පති සහ පිරිවෙන්වල පරිවෙනාධිපතිවරුන් වෙත පැවරෙන අතර ඊට අදාළ උපදේශනය ගණිත ගුරු උපදේශකවරුන් විසින් සැපයිය යුතු ය.

2.1.8 කොට්ඨාස, කලාප තරග කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහ පළාත් තරග පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පූර්ණ අධීක්ෂණය යටතේ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නියම කර ඇති කාලසටහනෙහි අදාළ කාල සීමාව තුළ දී පවත්වා අවසන් කළ යුතු ය.

2.1.9 කොට්ඨාස, කලාප සහ පළාත් මට්ටමේ සියලුම තරග ප්‍රතිඵල එම තරග පවත්වනු ලබන දිනයන්හි දී ම නිකුත් කළ යුතු ය. ලබාගත් සමස්ථ ප්‍රතිඵල ලේඛනය සමග එක් එක් තරගාවලි සඳහා ප්‍රථම ස්ථාන ලබාගත් කණ්ඩායම් පිළිබඳ විස්තර පාසලේ නම, ලිපිනය, කොට්ඨාසය, කලාපය පැහැදිලිව ලියා කලාප තරග අවසානයේ දී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යැවිය යුතු ය.

2.1.10 විනිශ්චය මණ්ඩලය තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර ඔවුන් ගණිත විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් විය යුතු ය. විනිශ්චය මණ්ඩලය දෙනු ලබන තීරණ කිසිදු ආකාරයකින් වෙනස් නොකළ යුතු ය. එක් එක් තරගාවලිය යටතේ විස්තර කෙරෙන ආකාරයට අනුව සෑම මට්ටමක දී ම ඒ ඒ තරග සඳහා විනිශ්චය මණ්ඩලයේ සංයුතිය තෝරා ගැනීම සිදු කළ යුතු ය. කොට්ඨාස හා කලාප මට්ටමේ තරග සඳහා විනිශ්චය මණ්ඩලය කලාප ගණිත විෂයය භාර නිලධාරි විසින් ද, පළාත් මට්ටමේ තරග සඳහා විනිශ්චය මණ්ඩලය පළාත් ගණිත විෂයභාර නිලධාරි විසින් ද පත් කළ යුතු ය.

2.1.11 පළාත් තරග අවසානයේ දී සමස්ත ලංකා තරගය සඳහා සහභාගි වන කණ්ඩායම් පිළිබඳ තොරතුරු හා නිර්දේශය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් දී ඇති ආකෘතිවලට අනුව ම (සමස්ත ලංකා ගණිත දැනුම මිනුම තරගාවලිය සඳහා ආකෘති අංක 1 ) සම්පූර්ණ කර අදාළ වසරේ අගෝස්තු 15 දිනට පෙර අධ්‍යාපන අධ්‍යක්ෂ, ගණිත ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල යන ලිපිනය වෙත එවිය යුතු ය. එසේ නිවැරදි ව නියමිත දිනයට පෙර අදාළ තොරතුරු නොඑවන තරග කණ්ඩායම්වලට සමස්ත ලංකා ගණිත තරගාවලියට ඉදිරිපත්වීමට අවස්ථාව දෙනු නොලැබේ.

## 3.0 සමස්ත ලංකා ගණිත දැනුම මිනුම තරගාවලිය පැවැත්වීමේ ක්‍රමවේදය සහ තරග කොන්දේසි

### 3.1 තරග ඉසව්

කණිෂ්ඨ අංශය, ජ්‍යෙෂ්ඨ - 1 අංශය, ජ්‍යෙෂ්ඨ - 2 අංශය සහ පිරිවෙන් වශයෙන් වෙන වෙන ම තරග ඉසව් හතරක් පැවැත්වේ. නමුත් සිංහල, දෙමළ මාධ්‍ය සහ ද්විභාෂා අධ්‍යාපන වශයෙන් ඉසව් වෙන් නොකෙරෙන අතර කිසියම් ඉසව්වක් නියෝජනය කිරීමට මාධ්‍ය භේදයක් නොමැතිව ඕනෑ ම ශිෂ්‍යයෙකුට අවකාශ ඇත.

### 3.2 සහභාගිත්වය

| තරග අංශය | ඉදිරිපත්වන කණ්ඩායමට අයත් තරගවදින සිසුන් ගණන | සිසුන් අයත් ශ්‍රේණි | එක් එක් ශ්‍රේණියෙන් කණ්ඩායමට අයත් සිසුන් ගණන | ඉදිරිපත්වන කණ්ඩායමට අයත් ආදේශක සිසුන් ගණන |
|---|---|---|---|---|
| කණිෂ්ඨ | 6 | 6 | 2 | 1 |
| | | 7 | 2 | 1 |
| | | 8 | 2 | 1 |
| ජ්‍යෙෂ්ඨ - 1 | 6 | 9 | 3 | 1 |
| | | 10 | 3 | 1 |
| ජ්‍යෙෂ්ඨ - 2 | 6 | 12 | 3 | 1 |
| | | 13 | 3 | 1 |
| විද්‍යායතන පිරිවෙන් | 6 | 9 | 3 | 1 |
| | | 10 | 3 | 1 |

වගු අංක 1 - එක් එක් ශ්‍රේණි යටතේ ගණිත දැනුම මිනුම තරග ඉසව් සඳහා සිසු සහභාගිත්වය

- කොට්ඨාස මට්ටමේ ගණිත දැනුම මිනුම තරගාවලිය සඳහා පාසල් නියෝජනය කරමින් කණ්ඩායම් ඉදිරිපත් වුව ද කලාප, පළාත් හා සමස්ත ලංකා මට්ටමේ ගණිත දැනුම මිනුම තරගාවලිය සඳහා එක් පාසලකට සීමා නොවී කොට්ඨාස/ කලාප/ පළාත් නියෝජනය කරන කණ්ඩායමක් වශයෙන් ඉහළ ලකුණු ලද සිසුන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් තරගයට ඉදිරිපත් කළ යුතු ය. සෑම තරග අදියරයක් ආරම්භයේ දී ම අවශ්‍ය පරිදි ආදේශක සිසුන් යොදවා ගනිමින් තරගවදින කණ්ඩායම් තෝරා ඉදිරිපත් කිරීමේ වගකීම කලාප/ පළාත් ගණිත විෂයය භාර නිලධාරීන් විසින් දැරිය යුතු ය.

- සමස්ත ලංකා තරගාවලියට කණ්ඩායම් ඉදිරිපත් කිරීමේ දී ඊට අයත් සිසුන් අදාළ වර්ෂයේ දී වගු අංක 01 පරිදි නියමිත ශ්‍රේණියේ ඉගෙනුම ලබන්නන් බවට අදාළ විදුහල්පති හෝ පරිවෙනාධිපති විසින් සහතික කළ යුතු ය. තව ද විදුහල්පති හෝ පරිවෙනාධිපති විසින් සහතික කරන ලද ඡායාරූපයක් බැගින් ද ඉදිරිපත් කළ යුතු ය. එම සහතිකය සමග ආදේශක සිසුන් ද ඇතුලුව තරග වදින කණ්ඩායමට අයත් සිසුන්ගේ නාම ලේඛනය පළාත් ගණිත විෂයය සම්බන්ධීකරණ නිලධාරි නිලමුද්‍රාව හා අත්සන සහිතව විනිශ්චය මණ්ඩලය වෙත

තරගය ආරම්භ වීමට පෙර භාර දීම මගින් තරගාවලියට සහභාගීවන්නන් 2.1.11 ඡේදයේ උපදෙස් පරිදි පළාත විසින් නිර්දේශ කරනු ලැබූ කණ්ඩායම ම බව තහවුරු කළ යුතු වේ. කණ්ඩායමක නිර්දේශිත නාම ලේඛනය විනිශ්චය මණ්ඩලය විසින් පිළිගනු ලබන සාධාරණ නොවැළැක්විය හැකි හේතුවක් මත වෙනස් කිරීමට සිදුව ඇති අවස්ථාවල දී ඒ බව ද ඉහත තහවුරු කිරීමේ දී සනාථ කළ යුතු ය.

## 3.3 ජාතික මට්ටමේ තරග පැවැත්වෙන ආකාරය හා අදාළ කොන්දේසි

### 3.3.1 තරගාවලිය පැවැත්වෙන ආකාරය

සමස්ත ලංකා ගණිත දැනුම මිනුම තරගාවලියෙහි ජාතික මට්ටමේ තරග අදියර තුනකින් සමන්විත වේ. ඉන් එක් එක් අදියර මගින් කණ්ඩායම් තෝරා ගන්නා ආකාරය මතු දැක්වේ.

**අදියර 01**

- පළමු අදියර වශයෙන් ඉසව්වකට පළාත් 9න් පළාත් කණ්ඩායම් 8 ක් තෝරාගැනීම සඳහා ශ්‍රේණි මට්ටමට අනුව ප්‍රශ්න 10කින් සමන්විත, කාලය මිනිත්තු 15ක් වූ ලිඛිත පරීක්ෂණයක් බැගින් පැවැත්වේ. අඩු ම ලකුණු ලබාගන්නා කණ්ඩායම තරගාවලියෙන් ඉවත් කෙරේ. (මෙම තේරීම් තරගයේ ලකුණු අවසාන තරගයට අදාළ නොවේ.)

**අදියර 02**

- ඉතිරිවන කණ්ඩායම් අට අවරෝහණ ලකුණු පෙළ ගැස්වීමට අනුව 1 සිට 8 දක්වා ස්ථාන අංක කර (1,5) ; (2,6) ; (3,7) සහ (4,8) වශයෙන් කණ්ඩායම් යුගල් කිරීමෙන් දෙවන තරග අදියරෙහි වට දෙකකින් යුත් පළමු කොටස එකම විටෙක ස්ථාන හතරක දී පැවැත්වේ. එහි දී කණ්ඩායම් ලබාගන්නා ලකුණු තරා කිරීම අනුව නැවත ඉහත ආකාරයට ම යුගල් කර එම අදියරේ වට දෙකකින් යුත් දෙවන කොටස එක ම විටෙක ස්ථාන හතරක දී පැවැත්වේ. පළමු හා දෙවන කොටස් දෙකෙහි ම ලකුණු එකතු කොට තරා කිරීමෙන් අනතුරුව වැඩි ම ලකුණු ලබා ගන්නා කණ්ඩායම් හතර, තුන්වන අදියර සඳහා තෝරා ගනු ලැබේ.

**අදියර 03**

- දෙවන තරග අදියරේ ලකුණු තරා කිරීම අනුව (1,3) සහ (2,4) කණ්ඩායම් අතර තෙවන අදියරේ තරග එකම විටෙක ස්ථාන දෙකක දී පැවැත්වේ. එහි දී ජයග්‍රාහී කණ්ඩායම් දෙක අතර තරගයෙන් සමස්ත ලංකා ගණිත දැනුම මිනුම තරගාවලියේ පළමුවන හා දෙවන ස්ථාන ද පරාජය වූ කණ්ඩායම් දෙක අතර තරගයෙන් තුන්වන ස්ථානය ද තෝරා ගනු ලැබේ.

### 3.3.2 ඉහත අදියර යටතේ තරගය පැවැත්විය යුතු ආකාරය සහ ලකුණු පටිපාටිය

- තරගය සඳහා කණ්ඩායමේ ළමුන් පහළ ශ්‍රේණියේ සිට ඉහළ ශ්‍රේණියට සිටින ආකාරයට අසුන්ගන්වනු ලැබේ. අදාළ තරගකරුවන්ට ප්‍රශ්න ඉදිරිපත් කරනුයේ පහළ ශ්‍රේණියේ සිට ඉහළ ශ්‍රේණිය දක්වා පිළිවෙලට ය.
- එක් තරග අදියරක දී එක් එක් ශ්‍රේණියකට ගැළපෙන ආකාරයට එක් වටයකට එක් පිළකට ප්‍රශ්න 6ක් බැගින් ඉදිරිපත් කෙරනු ඇත. එක් තරග වාරයක් එවැනි වට දෙකකින් යුක්ත වේ.
- ප්‍රශ්න තෝරාගැනීම කුසපත් ඇදීමෙන් සිදුකරනු ලැබේ.
- මුලින් ම ප්‍රශ්නය යොමු කරන කණ්ඩායම කාසියේ වාසිය උරගා බැලීමෙන් තීරණය කෙරෙන අතර දෙවන වටයේ දී අනෙක් පිළට මුල් වාරය හිමිවේ.

- එක් ප්‍රශ්නයක් එක් මාධ්‍යකින් උපරිමව දෙවරක් පමණක් කියවනු ලැබේ. (අවශ්‍යතාවය අනුව ප්‍රශ්න මාධ්‍ය දෙකෙන් ම (සිංහල/දෙමළ) ඉදිරිපත් කෙරේ.) ඊට අමතරව මාධ්‍ය දෙකෙන් ම ප්‍රශ්න ප්‍රදර්ශනය කෙරේ.

- අදාළ තරගකරුට පිළිතුරු දීම සඳහා කාලය තත්පර 90ක කාලයක් ලබා දෙනු ලැබේ. එම කාලය තුළ උත්සාහයන් දෙකකට අවසර ඇත. පිළිතුරට පමණක් නොව ගැටලුව විසඳූ ක්‍රමය සඳහා ද ලකුණු ලැබේ. ලකුණු පටිපාටියට අනුව අදාළ පියවර ඉදිරිපත් කිරීම අනුව නිවැරදි පිළිතුරට ලකුණු 10ක් ලැබේ.

- පිළිතුර නිවැරදි වුව ද පියවර වැරදි නම් ලකුණු නොලැබේ. එහෙත් පිළිතුර වැරදි වුව ද පියවර නිවැරදි නම් එම පියවර සඳහා ලකුණු ලැබේ. විනිශ්චය මණ්ඩලයට පිළිගත හැකි පරිදි කෙටි සහ නිවැරදි ක්‍රමවේදයන් සඳහා ද සුදුසු පරිදි ලකුණු පටිපාටියට අනුව ලකුණු ලැබේ.

- පළමු තරගකරුගේ පියවර නිවැරදි වුව ද පිළිතුර වැරදි නම් හෝ පියවර සහ පිළිතුර වැරදි නම් හෝ එම පිළේ ම අදාළ ශ්‍රේණියේ වෙනත් අයෙකුට ප්‍රශ්නය යොමු කෙරේ. කාලය තත්පර 15 කි. එක් උත්සාහයකට පමණක් අවසර ලැබේ. දෙවන තරගකරුවාගේ අදාළ පියවර ඉදිරිපත් කිරීම සහිත නිවැරදි පිළිතුරට ලකුණු පටිපාටියට අනුව ලකුණු හිමි වේ. හිමිවන උපරිම ලකුණු සංඛ්‍යාව 5කි.

- දෙවන තරගකරුගේ පියවර සහ පිළිතුර සියල්ල ම වැරදි නම් පමණක් ප්‍රශ්නය ප්‍රතිවිරුද්ධ පිළේ අදාළ ශ්‍රේණියේ වෙනත් අයෙකුට යොමු කෙරේ. කාලය තත්පර 15 කි. එක් උත්සාහයක දී පියවර සහ පිළිතුර සියල්ල නිවැරදි නම් ලකුණු 5ක් <u>පමණක්</u> හිමි වේ. ප්‍රතිවිරුද්ධ පිලේ තරගකරුගේ පියවර වැරදි වී පිළිතුර නිවැරදි වුව ද පියවර නිවැරදි වී පිළිතුර වැරදි වුව ද ලකුණු හිමි නොවේ.

- පහළ ශ්‍රේණියේ තරගකරුවෙකුට යොමු කරන ප්‍රශ්නයක් සඳහා කිසිදු විටෙක ඉහළ ශ්‍රේණියේ තරගකරුවෙකුගේ පිළිතුර පිළිනොගැනේ. නමුත් ඉහළ ශ්‍රේණියේ තරගකරුවෙකුගේ ප්‍රශ්නයකට පහළ ශ්‍රේණියේ තරගකරුවෙකුගේ පිළිතුර පිළිගැනේ.

- වට දෙක අවසානයේ කණ්ඩායම් දෙක ම සම ලකුණු ලබා ඇත්නම් දිනුම ලබා දීම සඳහා වරකට ප්‍රශ්න යුගලය බැගින් අවම ප්‍රශ්න යුගල සංඛ්‍යාවක් ඉහළ ම ශ්‍රේණියේ තරග කරුවන්ට ඉදිරිපත් කෙරේ.

- පළාත් ගණිත විෂයය සම්බන්ධීකරන නිලධාරි විසින් නම් කරනු ලබන නිලධාරීන් දෙදෙනෙකු බැගින් තරග නිරීක්ෂණය සඳහා සහභාගි කරවිය හැකි ය.

### 3.2.3 තරගයට ඉදිරිපත්වීම සහ විනිශ්චයට අදාළ කොන්දේසි

- සහභාගිත්වයට අදාළ 3.2 ඡේදයට අනුකූලව සහතික කරන නාම ලේඛනයට අයත් කණ්ඩායම පමණක් සමස්ත ලංකා තරගාවලිය සඳහා පළාත වෙනුවෙන් ඉදිරිපත් කළ යුතු ය.
- තරගකරුවන් පාසල් නිල ඇඳුමින් තරගයට සහභාගි විය යුතු ය.
- විනිශ්චය මණ්ඩලය තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර ඔවුන් ගණිත විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් විය යුතුය. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

### 3.2.4 සමස්ත ලංකා ගණිත දැනුම මිනුම තරගාවලියේ තරග කාලසටහන

පහත සඳහන් කාල පරාසයන් නොඉක්මවන පරිදි අදාළ තරග පවත්වා නිම කළ යුතු ය.

| තරගාවලිය | කලාප මට්ටම | පළාත් මට්ටම | සමස්ත ලංකා මට්ටම |
|---|---|---|---|
| ගණිතය දැනුම මිනුම | මැයි/ජූනි | ජූනි/ජූලි | සැප්තැම්බර් |

වගු අංක 2 - සමස්ත ලංකා ගණිත දැනුම මිනුම තරගාවලි සඳහා කාලරාමුව

### 3.2.5 සමස්ත ලංකා ගණිත දැනුම මිනුම තරගාවලියේ ජයග්‍රාහී කණ්ඩායම් සඳහා සහතික හා පදක්කම් පිරිනැමීම

- පළමු, දෙවන, තෙවන ස්ථාන ලබාගන්නා කණ්ඩායම්වල ආදේශක සිසුන් ඇතුලු සියලු තරගකරුවන් සඳහා සහතික පත්‍රය බැගින් ද, එම එක් එක් කණ්ඩායමට අදාළ ජයග්‍රහණ සංකේතවත් කෙරෙන පදක්කම බැගින් ද ප්‍රදානය කරනු ලැබේ.

- ජාතික මට්ටමේ තරගයේ අදියර දෙක සහ තුනෙහි දී ලබා ගන්නා ලකුණුවල එකතුවෙන් කණිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ අංශයන්හි වැඩිම ලකුනු ලබාගන්නා තරගකරුවන් තිදෙනා බැගින් තෝරා ඔවුන්ට විශිෂ්ඨ කුසලතා සහතික බැගින් පිරිනැමේ.

- සමස්ත ලංකා ගණිත තරගාවලිය සඳහා සහභාගි වූ පළමු, දෙවන හා තෙවන ස්ථාන නොලත් සෙසු කණ්ඩායම් නියෝජනය කළ ආදේශක සිසුන් ද ඇතුලුව තරගකරුවන්ට සහභාගිත්ව සහතිකයක් බැගින් පිරිනැමේ.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:-

1. විගණකාධිපති
2. අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන)
3. අතිරේක ලේකම් (ප්‍රතිපත්ති සැළසුම් හා කාර්යසාධන සමාලෝචන)
4. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය
5. ප්‍රධාන මුල්‍ය නිලධාරී
6. අධ්‍යක්ෂ (සැළසුම්)
7. අධ්‍යක්ෂ (පිරිවෙන්)
8. ලේඛනාගාරය